# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 44 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திகதி
Date — 10/01/2024
පැය 1140

## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු ගුවන්තොටුපල ඒකකය.**

2024.01.09 වන දින සවස් කාලයේදී කහතුඩුව පොලිස් වසමේ කහතුඩුව අධිවේගී පිවිසුම් මාර්ගය ආසන්නයේදී වයස අවුරුදු 41 කාන්තාවකට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කිරීමක් සම්බන්ධයෙන් කහතුඩුව පොලිස් ස්ථානය විමර්ශනයක් ආරම්භ කර තිබිණි.

මෙම ඝාතනයට සම්බන්ධ සැකකරු 2024.01.09 දින රාත්‍රියේ විදේශ ගතවීම සඳහා කටුනායක ගුවන්තොටුපල වෙත පැමිණ සිටියදී ගුවන්තොටුපල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන කහතුඩුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්ඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන පානදුර, වලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** කහතුඩුව පොලිස් ස්ථානය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය.**

2024.01.09 වන දින රාත්‍රි කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ පන්සිල්ගොඩ ප්‍රදේශයේදී ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1080 ක් (බැරල් 06) සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට මිනුවන්ගොඩ පොලිසියට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.